# බටහිර විද්‍යා ආධිපත්‍යය

බටහිර නූතනත්වය, යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය හා බටහිර විද්‍යාව අතර ඇති සම්බන්ධය ගැන තවත් බොහෝ දේ කිව යුතුව ඇත. අද බටහිර නූතනත්වයට හා අදාළ චින්තනයට ජයග්‍රාහී වීමට හැකි වී ඇත්තේ බටහිර විද්‍යාවේ හා ඒ ආශ්‍රිත තාක්ෂණයේ වර්ධනය හේතුකොටගෙන ය. එතරම් වැදගැම්මකට ඇති දෙයක් නොකියන බටහිර සමාජයීය විද්‍යාවන් හා බටහිර දර්ශනය ද සමාජයේ වැදගත් තැනක් ලබා ගෙන ඇත්තේ බටහිර විද්‍යාවේ, එනම් බටහිර ස්වාභාවික විද්‍යාවේ ජයග්‍රහන හේතුකොටගෙන ය. බටහිර ධනපති ක්‍රමයට ද මෙතරම් ආධිපත්‍යයක් පැතිරවීමට හේතු වී ඇත්තේ ද බටහිර විද්‍යාවේ වර්ධනයන් ය. කෙටියෙන් කියන්නේ නම් බටහිර ආධිපත්‍යය පැත්තෙන් බැලූ කල බටහිර නූතනත්වයේ වඩාත් ම ඵලදායී වර්ධනය නම් බටහිර විද්‍යාව ය. අද බටහිර පශ්චාත්නූතනවාදයක් ගැන කෑ කෝ ගසන මෙරට සිටින පුස්සන් නොදන්නා කරුණක් නම් බටහිර පශ්චාත්නූතනවාදය පවා මෙතරම් අවධානයට ලක්වන්නේ මූලික වශයෙන් ම විසිවැනි සියවසේ මුල බටහිර විද්‍යාවේ ඇති වූ වර්ධනයන් නිසා බව ය. සාපේක්ෂතාවාදය හා ක්වොන්ටම් භෞතික විද්‍යාව නොවන්නට බටහිර පශ්චාත්නූතනවාදයට ප්‍රවාද ගොඩ නගා ගැනීමට ඉඩක් නොතිබුණි.

සාපේක්ෂතාවාදය හා ක්වොන්ටම් භෞතික විද්‍යාව මතුපිටින් බටහිර නූතනත්වයට අභියෝග එල්ල කෙළේ ය. එහෙත් ඒ අභියෝග බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය වෙනස් කිරීමට අසමත් විය. අද වන විට සාපේක්ෂතාවාදය හා ක්වොන්ටම් භෞතික විද්‍යාව බටහිර චින්තනය තුළ හීලෑ කෙරී අවසාන ය. පසුගිය අවුරුදු පහක පමණ කාලය මේ අතින් වැදගත් වෙයි. ක්වොන්ටම් භෞතික විද්‍යාවේ තිබූ ඊනියා අතාර්කික බව අද වන විට බටහිර නූතනත්වය තුළ නැති වී ගොස් ය. අපේ රටවලින් බටහිරට ගිය ඇතැම් සංකල්ප බටහිර නූතනත්වය තුළට ගැනීමට බටහිර විද්‍යාඥයෝ කටයුතු කර ඇත්තාහ. එහෙත් ඒ බව මෙරට සිටින පශ්චාත්නූතනවාදී පුස්සන් නොව, බටහිර ඊනියා පශ්චාත්නූතනවාදීන් හෝ අවබෝධ කර ගෙන ඇති බවක් නොපෙනෙයි. බටහිර විද්‍යාවේ ඇතිවන වර්ධනයන් බටහිර සමාජීය විද්‍යාවන්ට හා අනෙකුත් ක්ෂෙත්‍රවලට කාන්දු වීමට සාමාන්‍යයෙන් අවුරුදු විසි පහකට වැඩි කාලයක් ගත වෙයි. අද බටහිර නවකතාවේ ඊනියා අතාර්කික මිනිස් සම්බන්ධකම් ගැන කතා කරන්නවුන්, යම් ආකාරයක චින්තන විප්ලවයක් අපේ රටවල මැදිහත් වීමකින් සිදු නොවුනහොත්, තව අවුරුදු විසිපහක් යන විට නැවතත් මුල, මැද, අග සහිත ඊනියා යථාර්ථවාදී තාර්කික නවකතාවට මාරු වනු ඇත. බටහිර සමාජයීය විද්‍යා, බටහිර දර්ශනය, බටහිර සාහිත්‍යය ආදිය බටහිර විද්‍යාව පසුපස නොන්ඩි ගසමින් යන ක්ෂෙත්‍ර පමණ ය. බටහිර විද්‍යාව තුළ වුව ද තවමත් ආධිපත්‍යය දරන්නේ බටහිර භෞතික විද්‍යාව ය. බටහිර රසායන විද්‍යාව හා බටහිර ජීව විද්‍යාව යනු බටහිර භෞතික විද්‍යාව පසුපස යන විෂය වෙයි.  ගැලීලියෝ, නිව්ටන් ආදී විද්වතුන් නොවන්නට බටහිර වර්ධනීය නූතනත්වයක්, බටහිර ධනපති ක්‍රමයක්, හා බටහිර දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ආධිපත්‍යයක් ඇති නොවන්නට තිබුණි.

බටහිර විද්‍යාව බටහිර නූතනත්වයට කෙතරම් වැදගත් දැයි බටහිරයෝ දනිති. එබැවින් ම බටහිර විද්‍යාවේ ආධිපත්‍යය තවත් තහවුරු කිරීමට, පැතිර වීමට ඔවුහු කටයුතු කරති. බටහිර විද්‍යාව යනු ලොව මෙතෙක් නොවූ ආකාරයක දැනුමක් ලෙස හැඳින්වීමට බටහිරයෝ උත්සාහ දරති. ඇත්ත හෙවත් සත්‍යය ඇත්තේ බටහිර විද්‍යාවේ යැයි ඔවුහු කියති. බටහිර විද්‍යාව ඊනියා යථාර්ථය පසක් කර ගැනීමට උත්සාහ දරණ බව බටහිර දාර්ශනිකයෝ කියා සිටිති. බටහිර විද්‍යාව පමණක් සත්‍යය යන අදහස ඒ සමග ලෝකයට ඒත්තු ගැන්වීමට බටහිරයෝ සමත් වෙති. එබැවින් යමක් සත්‍යය ද එය විද්‍යාත්මක විය යුතු ය යන ආප්තය (ඩොග්මා) ගොඩ නැංවීමට ඔවුන්ට හැකි වී ඇත. වෙනත් විෂයක දක්නට නැති ඊනියා විධි ක්‍රමයක් බටහිර විද්‍යාවේ ඇතැයි පෙන්වීමට බටහිර දාර්ශනිකයෝ උත්සාහ කරති. ඊනියා පර්යේෂණාත්මක ක්‍රමය මොන තරම් වැදගත් දැයි විධි ක්‍රම වේදීහු අපට කියා දෙති. බටහිර විද්‍යාවේ දර්ශනය හැදෑරීම සඳහා ම වෙන ම පිරිසක් වෙති. ඔවුන්ගේ විෂය විද්‍යාවේ දර්ශනය නමින් හැඳින්වෙයි. ඒ විෂය හදාරන්නෝ විද්‍යාවේ, එනම් බටහිර විද්‍යාවේ, දාර්ශනිකයෝ වෙති.

බටහිරයන්ගේ උත්සාහයන් යම් ප්‍රමාණයකට ඵල දරා ඇති බව පිළිගැනීමට සිදු වෙයි. අද ලංකාවේ වුව ද විශාල ප්‍රමාණයකට බටහිර විද්‍යාව එකම සත්‍යය බවට පත් වී ඇත. සත්‍යය දැන ගැනීමේ උරගල බවට බටහිර විද්‍යාව පත් වී ඇත. ඒ පිටුපස බටහිර දේශපාලන බලය ද වෙයි. මෙය චක්‍රීය ව සිදුවෙයි. බටහිර විද්‍යාවේ හා ඒ ආශ්‍රිත

© Prof. Nalin De Silva

තාක්ෂණයෙහි වර්ධනය බටහිර යටත්විජිතවාදය ද පසු කලෙක බටහිර ධනපති ක්‍රමය ද ශක්තිමත් කරයි. දැනුම බලය වේ යන්න මෙහි දී ක්‍රියාත්මක වෙයි. ඊළඟ අදියරේ දී බටහිර දේශපාලන බලය හේතුකොට ගෙන පාසල් හා විශ්ව විද්‍යාල හා වර්තමානයෙහි නම් ජනමාධ්‍යය ද උපයෝගී කර ගනිමින් බටහිර විද්‍යාව මෙන් ම බටහිර සමාජයීය විද්‍යා, බටහිර දර්ශනය හා බටහිර සාහිත්‍ය කලා ප්‍රචලිත කෙරෙයි. මෙහි දී බලය නිසා දැනුම ප්‍රචලිත කෙරෙයි. මේ දැනුම ඔස්සේ බටහිර විද්‍යාවට ආධිපත්‍යයක් ලබා දෙයි. ඒ ආධිපත්‍යය හරහා බටහිර දේශපාලන ආධිපත්‍යය තව තවත් තහවුරු කෙරෙයි. අද බටහිර විද්‍යා ආධිපත්‍යය කෙතරම් තහවුරු කෙරී ඇත් ද යතහොත්, බුද්ධාගම ද විද්‍යාත්මක කිරීමේ ප්‍රවනතාවයක් වෙයි. බටහිර විද්‍යාව පමණක් සත්‍යය නම් බුද්ධාගම සත්‍යය වීමට අනිවාර්ය අවශ්‍යතාවක් වන්නේ බුද්ධාගම විද්‍යාත්මක වීම ය. එබැවින් මෙරට සිටින අනුකාරක බෞද්ධයෝ බුද්ධාගම විද්‍යාත්මක කිරීමට කැස කවති.

මෙරට නොයෙකුත් වර්ගවල අධිරාජ්‍ය විරෝධීහු, යටත්විජිත විරෝධීහු වෙති.  එහෙත් මේ බොහෝ දෙනා දැනුම සම්බන්ධයෙන් ගත් කල අධිරාජ්‍යවාදීහු වෙති. බටහිර විද්‍යාව ද දැනුමෙහි කොටසක් වෙයි. දැනුම යනු නිර්මාණය කෙරෙන්නක් බව කියන ඇතැමුන්ට වුව ද බටහිර විද්‍යාව ද නිර්මානය කෙරෙන්නක් බව නොවැටහෙයි. නැතහොත් ඔවුහු එසේ නොවැටහෙන තත්වයකට පත්කරනු ලැබ සිටිති. මෙරට සිටින්නේ යැයි කියන ඊනියා පශ්චාත්නූතනවාදීන්, නව කලා විචාරකයන් ආදීන්ගෙන් ඇසුවහොත් ඔවුන් බටහිර විද්‍යාව වාස්තවික යථාර්ථයක් පිළිබිඹු කෙරෙන්නක් ලෙස සලකනු දැන ගත හැකි ය. ඔවුන් එවැනි තත්වයකට පත්කර ඇත්තේ බටහිර දැනුම මගිනි. බටහිර ඊනියා පශ්චාත්නූතනවාදීන්ට අනුව අප ජීවත්වන්නේ භාෂා නිර්මිත අවකාශයක ය. ඔවුන්ට අනුව අපේ සිතුම් පැතුම් හසුරවනු ලබන්නේ භාෂාව විසිනි. මෙහි භාෂාව යන්න ඉතාමත් පටු ක්ෂෙත්‍රයක ක්‍රියාත්මක වන්නකි. භාෂාව වෙනුවට සංඥාව යන්න යොදා ගත්ත ද එහි පටු බවක් වෙයි. අපේ සිතුම් පැතුම් හසුරවන්නේ සමාජය හෙවත් සංස්කෘතිය යැයි කීව ද එහි ද පටු බවක් වෙයි. එහි සංස්කෘතික කොටසට අමතර ව ජෛවීය කොටසක් ඇතැයි කීව ද එය ද ප්‍රශ්නයට දෙන එක් පිළිතුරක් පමණකි. අපේ සිතුම් පැතුම් හසුරවන්නේ සංස්කෘතික හා ජෛවීය ආකාරයකින් ය යන්න බටහිර නිෂ්පාදිත දැනුමක් බව මෙරට සිටින ඊනියා පශ්චාත්නූතනවාදී පුස්සන්ට නොතේරෙන්නේ ද? ඒ දැනුම විසින් අප මෙහෙයවෙන බව ඔවුන්ට අවබෝධ නොවන්නේ ඔවුන්ට ඒ දැනුම හැරෙන්නට වෙනත් දැනුමක් නොමැති බව ඒත්තු ගන්වා ඇති බැවින් නොවේ ද?

අපේ සිතුම් පැතුම් සංස්කෘතික ව, ජෛවීය ව හා සාංසාරික ව හැසිරවෙන්නේ යැයි කිවහොත් ඒ ගැන මෙරට සිටින අනුකාරක ඇංකරයන් කියන්නේ කුමක් ද? අපේ සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය කෙරෙන දැනුමක සාංසාරික සංරචකය ද ඇතුළත් වෙයි. ගැහැණියක පිරිමියකු ලෙස හෝ පිරිමියකු ගැහැණියක ලෙස (මේ සමාජයේ ගැහැණුන් මෙන් ජීවත් වීමට කැමති පිරිමින් නැතැයි යමකු කියන්නේ ද?) හෝ ජීවත්වීමට කැමති නම් එයට විවිධ හේතු තිබිය හැකි ය. එය ඊනියා පුරුෂෝත්තමවාදයකට පමණක් ලඝු කර එය සමාජයේ සාමාන්‍යයක් බවට පත් කළ හැකි නොවේ. සංසාරයේ පිරිමියකු ලෙස ආත්ම ගණනාවක් ගත කළ අයකු මේ භවයේ ගැහැණියක වුව ද පිරිමියකු ලෙස ජීවත් වීමට කැමැත්ත දැක්වීමට සම්භාවිතාවක් ඇත. එසේ නැතැයි කිව හැක්කේ සංසාරයක් නැතැයි හෝ සංසාරය යන්න ඊනියා පාරභෞතිකයක් යැයි හෝ කියන්නකුට ය. යම් පුද්ගලයකු සංසාරයක් නැතැයි කියන්නේ බටහිර දැනුමේ ගොදුරක් බවට පත්වීමෙනි. එහෙත් එසේ කියන්නාට තමා එසේ බටහිර දැනුමේ ගොදුරක් වී ඇති බව නොවැටහෙයි. සංසාරය ඇති බව විද්‍යාත්මක ව ඔප්පු කරන්නට යැයි යමකු කියන්නේ නම් ඉන් කියැවෙන්නේ දැනුමේ උරගල, මිනුම් දණ්ඩ බවට බටහිර දැනුම පත් වී ඇති බව ය. සංසාරයක් නැතැයි යන්න බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයෙහි ඵලයක් වෙයි. බටහිරයන් අනුව යමින් සංසාරයක් නැතැයි කියන්නෝ සංස්කෘතික ක්‍රිස්තියානීහු වෙති. එහෙත් ඔවුන් පවසනු ඇත්තේ ඔවුන්ට දේශ සීමා නැත ආදී අනම් මනන් ය. තමන්ගේ දැනුමට, තමන්ගේ කලාවට දේශ සීමා නැතැයි කියන්නෝ අවසාන විග්‍රහයෙහි දී බටහිර දේශ සීමා තුළ ජීවත් වන්නෝ වෙති.

දැනුම සංස්කෘතියෙන් ස්වායත්ත නොවන බව මේ කරුණුවලින් වුව ද පැහැදිලි විය යුතු නමුදු මෙරට සිටින පණ්ඩිතවාදී පුස්සන්ට ඒ බව නොවැටහෙන්නේ ඔවුන් මොන තරම් භාෂා නිර්මිත අවකාශ ගැන කතා කෙරුව ද ඔවුන් ජීවත් වන්නේ බටහිරයන් විසින් නිර්මිත භාෂා ලෝකයක බැවිනි. මේ බටහිරයන් විසින් නිර්මිත භාෂා ලෝකයෙහි ජීවත්වන්නන්ට වෙනත් සංස්කෘතීන් විසින් නිර්මාණය කෙරෙන දැනුම් ඇති බව නෙවැටහෙයි. ඒ ඔවුන් බටහිරයන් විසින් දීනයන් බවට පත් කෙරී ඇති බැවිනි. අපි එක් කරුණක් හොඳින් තේරුම් ගමු. යමකු යම් දැනුමක් (බටහිර)

© Prof. Nalin De Silva

විද්‍යාත්මක ව ඔප්පු කරන්න යැයි කියන්නේ ම බටහිර සංස්කෘතියේ හා බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයේ වහළකු හෝ වහළියක හෝ ලෙස බව ය.

බටහිරයන් අප පාලනය කිරීමේ දී බටහිර විද්‍යාව ඇතුළු බටහිර දැනුම යොදා ගන්නේ අපට නොදැනී ය. මෙයින් කියැවෙන් අප බටහිර විද්‍යාව හා අනෙක් බටහිර දැනුම් ඉගෙන නොගත යුතු ය යන්න නොවේ. අප ඒ ඉගෙන ගත යුතු ය. එහෙත් අප ඉගෙන ගන්නේ අප පාලනය කිරීම සඳහා යොදා ගන්නක් බව අප කිසි විටෙකවත් අමතක නොකළ යුතු ය. බටහිර විද්‍යාවෙන් ලබා ගත හැක, ලබා ගත යුතු සියල්ල අප ලබා ගත යුත්තේ නිර්මාණාත්මක ව අප සංස්කෘතිය තුළ හිඳිමින් ය. ඒ අතර අපි අපේ ම වූ දැනුමක්, අපේම වූ ප්‍රවාද, අපේ ම වූ සංකල්ප නිර්මානය කිරීමට උත්සාහ ගත යුතු වෙමු. බටහිරයන් බටහිර විද්‍යාවට වෙන ම වූ ඊනියා විධි ක්‍රමයක් ඇතැයි පවසන්නේ බටහිර විද්‍යාවෙහි ආධිපත්‍යය අපට ද නොදැනී අපට පැටවීමට ය. බටහිර විද්‍යාවට වෙන ම විධි ක්‍රමයක් ඇති බවත්, පර්යේෂණාත්මක ක්‍රමය එහි අරටුව බවත් පවසන බටහිර දාර්ශනිකයෝ හා විද්‍යාඥයෝ, මේ විධි ක්‍රමය පළමු ව ලෝකයට හඳුන්වා දුන් තැනැත්තා ගැලීලියෝ ගැලීලි යන විද්වතා යැයි පවසති. ඔහු පර්යේෂණාත්මක ක්‍රමයේ පියා ලෙස ද හැඳින්වෙයි. මේ සියල්ල පට්ටපල් බොරු වෙයි. මේ බොරු නිර්මාණය කෙරී ඇත්තේ බටහිර විද්‍යා ආධිපත්‍යය හරහා බටහිර ආධිපත්‍යය පැතිරවීමට ය. බටහිර විද්‍යාවේ විධි ක්‍රමයක් යනුවෙන් විශේෂිත විධි ක්‍රමයක් නොමැත. බටහිර විද්‍යාව ඇතුළු බටහිර දැනුම නිර්මාණය කෙරී ඇත්තේ බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය තුළ ය. ඒ දැනුම අනෙක් දැනුම් පද්ධතීන්ගෙන් වෙනස් වන්නේ මේ චින්තනයේ ඇති වෙනස නිසා මිස ඒ යොදා ගන්නා ඊනියා විධි ක්‍රමයක් නිසා නොවේ. බටහිරයන් ඊනියා විධික්‍රමය සම්බන්ධයෙන් නගන බොරු ඝෝෂාව තේරුම් ගැනීමට අපි පළමුව ගැලීලියෝ විද්වතා විසින් හඳුන්වා දෙන ලද්දේ යැයි කියන ඊනියා පර්යේෂණාත්මක ක්‍රමය සලකා බලමු. පර්යේෂණාත්මක ක්‍රමය ගැලීලියෝ පඬිවරයා විසින් හඳුන්වා දෙන ලද්දේ යැයි කියැවෙන විට ඉන් ප්‍රකාශ වන වැදගත් කරුණ නම් ඉන් පෙර ලෝකයේ කිසිම තැනක කිසිම අවධියක මේ පර්යේෂණාත්මක ක්‍රමය නොතිබූ බව ය. විශේෂයෙන් ම බටහිර ග්‍රීකයන් පර්යේෂණ නොකළ බව කීම මෙහි එක් අරමුණක් වෙයි. එහෙත් ඒ එසේ නොවේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva